4 වන පිටෙන්

ගිවිසුමක් අත්සන් කළා. ඒ විතරක් නෙවෙයි 1989දී මාස 13කට ආසන්න කාලයක් නේපාලනයට සම්බාධක දානවා. ඒ නිසා ඉන්දියාව කටයුතු කළේ අසල්වැසි රාජ්‍යයන්ගේ 'ලොකු අයියා'ගේ භූමිකාවට පණ දෙමින්. පාකිස්ථානය සමඟ අවස්ථා තුනකදී යුද ගැටුම් නිර්මාණය කර තිබෙනවා. මාලදිවයිනේ ඇතිවුණ හමුදා කුමන්ත්‍රණයකදී ඉන්දියානු හමුදා මැදිහත් කළා. ඉතිහාසය සාක්ෂි දරා තිබෙනවා මේ කලාපයේ ඉන්දියානු භූමිකාව අධිපතිවාදී හා බලහත්කාරී මැදිහත්වීමක් තිබෙන බවට.

වර්තමාන ඉන්දියාවේ ජනගහනය කෝටි එකසිය විසිහතහමාරයි. ශ්‍රම බළකාය මිලියන 532යි. ඒ වගේම එක්කෝටි විසිහය ලක්ෂයක් ළමා ශ්‍රමිකයන් ඉන්නවා. ලෝකයේ වැඩිම ළමා ශ්‍රමිකයන් සංඛ්‍යාවක් ඉන්නේ ඉන්දියාව තුළයි. කෝටි එක හමාරකට ආසන්න ජනගහනයක් වහල් ජීවිත ගත කරනවා. ඒ විතරක් නෙවෙයි, ශ්‍රම බළකායෙන් 7%ක් විරැකියාවෙන් පෙළනවා. 7%ක් කියන්නේ ආසන්න වශයෙන් ලක්ෂ 370ක්. ආණ්ඩුවේ සංඛ්‍යා ලේඛනවලට අනුව ලංකාවේ විරැකියාව ශ්‍රම බළකායෙන් 4.1%ක් එනම් ලක්ෂ 3.5යි. ඒක පුද්ගල ආදායම ඉන්දියාවේ ඇ.ඩො. 1688ක් වෙනකොට ලංකාවේ ඇ.ඩො. 3276යි. ලංකාවේ පුරවැසියෙකුට ලැබෙන ආදායමෙන් හරි අඩයි ඉන්දියාවේ පුරවැසියෙකුට ලැබෙන්නේ. දවසක ආදායම දිනකට ඩොලර් 1.25ක ලබන කෝටි 27ක ජනතාවක් ඉන්දියාවේ ජීවත් වෙනවා. එය ලංකාවේ ජනගහනය මෙන් දහතුන් ගුණයක්. ඉන්දියාවේ අඩු බර දරු උපත් අනුපාතය 30%ක් වෙනවා. ඒ වගේම දරිද්‍රතා රේඛාවෙන් පහළ සිටින විශාල ජන කොටසක් ඉන්දියාවේ ජීවත් වෙනවා.

ඉන්දියානු වර්තමාන පාලනය ඉන්දියානු ජනතාවට යහපත් ජීවිතයක් ගෙන දීමට සමත්වෙලා නැහැ. ඔවුන් සෞඛ්‍ය අනාරක්ෂිතතාවයෙන් පහළට ඇද දමා තිබෙනවා නම්, පාසැල්වල ගොඩනැගිලි කඩාගෙන වැටෙනවා නම්, ගං වතුරට මිනිස්සුන් මිය යනවා නම්, නියඟෙට මිනිසුන් මැරෙනවා නම්, වසූරිය වැනි මහා රෝග පැතිරෙමින් තිබෙනවා නම්, විරැකියාවෙන් පෙළෙනවා නම්, නූගතුන් වැඩි වෙනවා නම්, වනචාරී යුගයට අයත් සමහර ජනපද තිබෙනවා නම්, ඉතාම පහත් අඩියකයි ඉන්දියාව තිබෙන්නේ.

## මුල් ගිවිසුමේ ප්‍රතිපල

1998දී මුලින්ම අපි ඉන්දු ලංකා නිදහස් වෙළඳ ගිවිසුමක් අත්සන් කළා. ලංකාව කියන්නේ ඉතා කුඩා වෙළඳපොළක් තිබෙන රාජ්‍යයක්. ලංකාවේ වෙළඳපොළට දිනකට ළඟා වෙන්නේ ලක්ෂ 30ක ජනතාවක් පමණයි. නමුත් ඉන්දියාවේ වෙළඳපොළ ප්‍රමාණය මිලියන 380ක් වෙනවා. ඉන්දියාවට විශාල වෙළඳපොළක් තිබෙනවා. ගිවිසුම අත්සන් කරන කාලයේ ආණ්ඩුව අපිට කිව්වා, ඉන්දු ලංකා ගිවිසුම නිසා අපිට විශාල වෙළඳපොළකට යන්න පුළුවන් කියලා. එම ගිවිසුම් මගින් දැන් සිදුවී තිබෙන්නේ ලංකාවේ ආරක්ෂාවී තිබූ නිෂ්පාදන ටිකත් බිඳ වැටීමයි. ඉන්දියානු වෙළඳපොළේ අපිට ඉඩක් නැහැ. 2000 සිට ක්‍රියාත්මක වුණු එම ඉන්දු-ලංකා වෙළඳ ගිවිසුමේ ආරම්භ වනවිට වෙළඳපොළ වටිනාකම ඩොලර් මිලියන 674යි. වෙළඳපොළ දියුණු වෙනවා කිව්වට කොපමණ ප්‍රමාණයකින් වර්ධනය වුණාදැයි අපි තවම දන්නේ නැහැ. අලුත් ගිවිසුමක් ගැන සාකච්ඡා කරන මේ මොහොතේ එම පැරණි ගිවිසුමේ අලුත් තත්වය පිළිබඳව සාකච්ඡා පැවැත්වෙමින් තිබෙනවා. නමුත් අපි තවම දන්නේ නැහැ, ශ්‍රී ලංකාව සහ ඉන්දියාව අතර තිබෙන වෙළඳාමේ වටිනාකම කොච්චරද කියලා. ඉන්දු ලංකා ගිවිසුමෙන් පසු ඉන්දියාවෙන් ලංකාවට ආපු භාණ්ඩ ප්‍රමාණය සීග්‍රයෙන් වැඩිවුණු අතර ලංකාවේ අපනයනය තවමත් තිබෙන්නේ ඉබි ගමනේ.
මේ වනවිට ලංකාවෙන් අපනයනය කරන භාණ්ඩ ප්‍රමාණය ඩොලර් මිලියන 625ක් පමණයි. ඉන් 40%ක්ම ඉන්දු ලංකා වෙළඳ ගිවිසුමට පිටින් යවන භාණ්ඩයි. ගිවිසුමට අදාළ භාණ්ඩ ප්‍රමාණය ඉතාම කුඩයි. කිසිදු ගිවිසුමක් නොමැති ඇමරිකාවට ලංකාවේ අපනයනවලින් 24.5ක%ක ප්‍රමාණයක් යවනවා. බ්‍රිතාන්‍යයට 10%ක් අපනයනය කරනවා. ගිවිසුමක් අවුරුදු 15ක් ක්‍රියාත්මක වෙලත් ළඟම රට වූ ඉන්දියාවට යවන ප්‍රමාණය 5.6%ක් තරම් කුඩයි. ඒ නිසා පැහැදිලිවම පෙනෙනවා, ඉන්දියාව විසින් අපේ භාණ්ඩවලට සහන දුන්නේ නැහැ කියලා. ඒ විතරක් නෙවෙයි අපේ භාණ්ඩ අපනයනයට ඉන්දියාව විවිධ බාධා ඇතිකළා. සීමා ඇතිකළා. ඉන්දියානු මධ්‍යම ආණ්ඩුව සමඟ ශ්‍රී ලංකාව ගිවිසුම් අත්සන් කළත් ඉන්දියාවේ ඇතැම් ප්‍රාන්තවලට භාණ්ඩ අපනයනයේදී වෙනමම බද්දක් ගෙවීමට සිදුවෙනවා. ඉන්දියානු මධ්‍යම ආණ්ඩුවේ පාලනයකින් තොරව ප්‍රාන්ත මගින් අයකරන බදු ගෙවා අපිට භාණ්ඩ අපනයනය කරන්න වෙනවා. එනිසා ඉන්දු ලංකා වෙළඳ ගිවිසුම් ඉතාම අවාසිදායකයි. නමුත් ඉන්දියාව ශ්‍රී ලංකාවේ විශාල වෙළඳ පංගුවක් අත්පත්කරගෙන තිබෙනවා.

ඒ විතරක් නෙවෙයි, ඉන්දියාව අපේ රටේ ඉදිකිරීම් ක්ෂේත්‍රයට මැදිහත් වුණා. අපේ රටේ කොළඹ-මාතර දුම්රිය මාර්ගය අධිවේගී කළා. ඩො.මිලියන 150 ව්‍යාපෘතිය ටෙන්ඩර් කැඳවීමකින් තොරවම ඉන්දියානු රයිට් සමාගමට දුන්නා. ගාල්ල මාතර කොටසට පමණක් ඩොලර් මිලියන 60ක් වියදම් කළා. නමුත් අධිවේගී දුම්රිය මාර්ගයක් විදියට අපි කිසිදු වාසියක් අත්වුණේ නැහැ. රේල් පීලියි, කොට ටිකයි ගලවලා හයි කළා පමණයි. ඩලස් අලහප්පෙරුම ප්‍රවාහන ඇමතිවරයාව සිටියදී උතුරු මිතුරු කියලා ව්‍යාපෘතියක් පටන් ගත්තා. ලංකාවේ උතුර සහ දකුණ යාකරන ව්‍යාපෘතිය ලෙස තමයි එය නම්කර තිබුණේ. ඒ වෙනුවෙන් විශාල වියදමක් සිදුකර රූපවාහිනී චැනල්වල එකම වෙලාවේ දැන්වීම් පළකළා. ජනතාවට කිව්වා තමන්ට පුළුවන් ප්‍රමාණයෙන් ව්‍යාපෘතියට දායක වෙන්න කියලා. ඕමන්තේ සිට තලෙයිමන්නාරමටත් මැදවච්චියේ සිට කන්කසන්තුරේටත් එම ව්‍යාපෘතිය සිදුකරන්න බලාපොරොත්තු වුණා. ඒ වෙලාවේ ජනාධිපතිවරයා ඉන්දියාවට ගියා. ඉන්දීය ජනාධිපතිවරයා කිව්වා, මේ ව්‍යාපෘතිය කෑලි 4කට කඩන්න කියලා. ඕමන්තෙයි සිට පලෙයි, පලෙයි සිට කන්කසන්තුරෙයි, මැදවච්චියේ සිට මඩු, මඩු සිට තලෙයිමන්නාරම ලෙස ව්‍යාපෘතිය කැඩුවා. ඉන්දියාව කෑලි 3ක් ඉල්ලුවා. අපේ දුම්රිය දෙපාර්තමේන්තුව සැලසුම් සකස් කරලා ජනතාවගෙන් මුදල් එකතු කරලා තිබියදී ඒ ව්‍යාපෘතිය ඉන්දියාවට දුන්නා.

## ආර්ථිකයට මැදිහත්වීම

ශ්‍රී ලංකාවේ කාවේරි ද්‍රෝණියේ තෙල් නිධි සම්බන්ධයෙන් ද්විමාන තාක්ෂණ පරීක්ෂණවලින් සොයා ගැනීම් කළා. කිසිදු වෙන්දේසි කිරීමකින් තොරව කාවේනි ද්‍රෝණියේ තෙල් නිධිය කොටස් 7කට කඩලා ඉන්දියාවට කොටසක් දුන්නා. රාජ්‍ය භාගය 10%යි. 28%ක් 'කායින්' සමාගමට බදු තිබුණා. බැසිල් රාජපක්ෂ එම බද්දත් ඉවත් කරලා දුන්නා. ඉන්දියාවේ කායින් සමාගම විසින් ලබාගත් එම බිම් කොටස කැනීම් නොකර තවමත් තියාගෙන ඉන්නවා. ඒ වගේම දොරෙයිඅප්පා ක්‍රීඩාංගණය, කන්කසන්තුරෙයි වරාය, පාලලි ගුවන්තොටුපොළ අලුත්වැඩියා කිරීමේ සියලු ව්‍යාපෘති ඉන්දියාව විසින් අත්පත් කරගත්තා. නිලාවේලි වෙරළේ අක්කර 4ක මනරම් ඉඩමක් ඉන්දියානු සමාගමකට දුන්නා. පුල්මුඩේ ඛනිජ වැලි නිධිය 'බිරලා' සමාගම ගන්න හැදුවා. ඒ වගේම මේ වනවිට ලංකාවේ බලශක්ති ක්ෂේත්‍රයට ඉන්දියාව මැදිහත් වෙමින් ඉන්නවා. ලංකාවේ පෙට්‍රල් ෂෙඩ් 107ක් සහ කොළොන්නාවේ තෙල් ගබඩා සංකීර්ණයෙන් 1/3ක් ඉන්දියාවේ අයි.ඕ.සී. සමාගමට ඩො.මි. 82කට දුන්නා. අපේ රටේ තෙල් වෙළෙඳාමෙන් 1/3ක් ඉන්දියාව අත්පත් කරගෙන ඉන්නවා. තවත් 1/3ක් ඉන්දියාවේ භාරත ඔයිල් සමාගමට දෙන්න සැලසුම් හදලා තිබුණා. 2005 ආණ්ඩු පෙරළියත් සමග එය ආණ්ඩුව සතුකරගත්තා.

ත්‍රිකුණාමලයේ අපිට තිබුණු තෙල් ටැංකි 105ක් අයි.ඕ.සී. සමාගමට කුළියට දුන්නා. ඉන්දියාව සමඟ සාම්පූර් බලාගාර ව්‍යාපෘතිය හදන්න ගිවිසුමක් අත්සන් කළා. ගිවිසුමට අනුව ඉන්දියාව ඩොලර් මිලියන 75ක්, ලංකාව ඩොලර් මිලියන 75ක් ආයෝජනය කර ඒකාබද්ධ සමාගමක් හදනවා. සමාගමෙන් ඩොලර් මිලියන 350ක් ණයට අරගෙන ඩො.මි. 500කින් ව්‍යාපෘතිය සම්පූර්ණ කිරීමටයි ගිවිසුම අත්සන් කළේ. ඇත්තටම ඉන්දියාව ආයෝජනය කරන්නේ මිලියන 75ක් පමණයි. ඉන් පසු ඉන්දියාව විදුලිය මිලදී ගැනීමේ ගිවිසුමක් අත්සන් කරනවා. එම ගිවිසුම අත්සන් කිරීම නිසා පමණක් ලංකාවට අවුරුද්දකට කෝටි 450ක අලාභයක් සිදුවෙනවා. මේ ආකරයට ඉන්දියාව මුළුමනින්ම අපේ රටේ බලශක්ති ක්ෂේත්‍රයට මැදිහත් වෙමින් ඉන්නවා. ඒ විතරක් නෙවෙයි ලංකාවේ වෙළඳපොළ ඉන්දියාව විසින් ගිලගෙන තිබෙනවා. සිංහල බෙහෙත් බඩු කියලා බෝඩ් එක තිබුණට කටුවැල්බටු, පත්පාඩගම් ඉඳලා සියලුම බෙහෙත් වර්ග ඉන්දියාවෙන් ගේනවා. බෙහෙත් වෙළඳාමෙන්, රෙදි වෙළඳාමෙන් විශාල පංගුවක් පරිප්පු වෙළෙඳපොලෙන් 72%ක් ළූණු වෙළෙඳපොලෙන් 56%ක් මිරිස් වෙළෙඳපොළෙන් 72%ක් තෙල් වෙළෙඳපොළෙන් 33%ක් ඉදිකිරීම් ක්ෂේත්‍රයේ විශාල පංගුවක් හෝටල් ක්ෂේත්‍රයේ විශාල පංගුවක් ඉන්දියාව විසින් අත්පත් කරගෙන තිබෙනවා. එසේ වුවත් ඉන්දියාවට තවමත් බැරිවෙලා තිබෙනවා ලංකාවේ සේවා වෙළඳපොළ අත්පත්කර ගන්න. ඉන්දියාවෙන් භාණ්ඩ කොපමණ ගෙන්වුවත් අපේ රටේ ඉංජිනේරුවාට, වෛද්‍යවරයාට, පෙදරේරුවාට තවමත් ශ්‍රම වෙළඳපොළට මැදිහත් වෙනවා. තවමත් ඉන්දියාවට අත්පත් කර ගන්න නොහැකි වුණු එම ශ්‍රම වෙළඳපොළ විවෘත කරලා දෙන්න කියලා තමයි සිපා ගිවිසුම ගෙනාවේ.

මීට පෙර අත්සන් කරන ලද සීපා ගිවිසුම හරහා වෙළඳාම කොටස් 4කට බෙදුවා. දේශ සීමා හරහා සීමාවන සේවා (පුද්ගලයා හුවමාරු නොවී සේවාව පමණක් හුවමාරු වෙනවා), විදේශ පරිභෝජනය, වානිජමය අවශ්‍යතාවයන් සඳහා රටට තුළට පැමිණීම සහ පෞද්ගලික සංක්‍රමණ එම කොටස් 4යි. නමුත් මෙම සේවාවන්වලදී තවමත් විවිධ බාධා තිබෙනවා. නිදහසේ සිදුවෙන්නේ නැහැ. එනිසා මෙම එට්කා ගිවිසුමේ ප්‍රධාන අරමුණ තිබෙන්නේ එම බාධාවන් ඉවත් කරගැනීමයි. පුද්ගල සංක්‍රමණ ගැන කතාබහක් මතුවෙලා තිබුණට අනෙකුත් ක්ෂේත්‍ර සම්බන්ධයෙන් තවමත් කතාබහක් මතුවෙලා නැහැ. මේ ගිවිසුම හරහා බැංකු, ආරෝග්‍ය ශාලා සහ වෙළඳ ප්‍රචාරණයට පවා දොරටු විවෘත කරනවා. පුද්ගල සංක්‍රමන පිළිබඳව මලික් සමරවික්‍රම කියනවා ඉදිරි සාකච්ඡාවලදී වෘත්තීමය ශ්‍රම නිදහස්කරණය, නැව් තැනීම හා තොරතුරු උපාංශවලට පමණක් සීමා කිරීමට බලාපොරොත්තු වෙනවා කියලා.

## රැකියා වියුක්තිය

ඉන්දියාවේ අවුරුද්දකට උපාධිධාරීන් ලක්ෂ 30ක් එළියට එනවා. ලංකාවේ 30,000යි. එයින් ඉංජිනේරු සහ තාක්ෂණික විෂය ධාරාවෙන් උපාධිය හදාරන්නන් 65%කට රැකියා අවස්ථා නැහැ. සාමාන්‍ය උපාධිධාරීන්ගෙන් 10%කට රැකියා අවස්ථාව ලැබෙනවා. ඉන්දියාවේ ශ්‍රම වෙළඳපොළෙන් මිලියන 500කින් 94%ක්ම නියෝජනය කරන්නේ අවිධිමත් රැකියායි. විධිමත් රැකියා තිබෙන්නේ 6%ක් පමණයි. එයට තිබෙන හොඳම උදාහරණයක් තමයි පසුගියදා හින්දුස්ථාන් ටයිම්ස් පුවත්පත වාර්තා කළ ප්‍රවෘත්තියක්. උත්තර් ප්‍රාන්තයේ එක් ආයතනයක ලිපිකරු තනතුරු 368කට ඉල්ලුම්පත් ලක්ෂ 23ක් ලැබී තිබුණා. 150,000ක් උපාධිධාරීන්. 24,969ක්

20 වන පිටට

සන්නස Cartoon by PK

